**ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්ම - 2021**

ලෝක බැංකු අරමුදල් සපයන ආයෝජන ව්‍යාපෘතියේ හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ සංචිත සැකැස්මේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අන්තර්ජාතික සංවර්ධන සංගමය අතර 2020 සැප්තැම්බර් 08 දින එළඹි අංක 6371 එල්කේ, 6228 එල්කේ, 8878 එල්කේ සහ 6346 එල්කේ දරන මූල්‍ය ගිවිසුම්වල විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුමට අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ඉහත සඳහන් ව්‍යාපෘතිවල හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකය සක්‍රීය කිරීම සහ සෞඛ්‍යය, සමාජ ආරක්ෂණ, කෘෂිකර්ම, අධ්‍යාපන සහ ප්‍රවාහන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විසඳුම් භාවිතයෙන් දුරස්ථව රාජ්‍ය සේවා සැපයීම වැනි කෙටි හා මධ්‍ය කාලීන මැදිහත්වීම් සහිතව කොවිඩ් – 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාර සහ ප්‍රතිසාධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා එක් හදිසි ක්‍රියාකාරී සැලැස්මක් උපයෝගී කර ගනිමින් කාර්යක්ෂම හා සම්බන්ධීකරණයෙන් යුත් ප්‍රතිචාර දැක්වීමක් සහතික කිරීම පිණිස ඒකාබද්ධ සම මූල්‍ය පදනම මත හදිසි ප්‍රතිචාර දැක්වීමේ සංරචකයේ එක් සංචිත ගිණුමක අරමුදල් රැස් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,491කට සමාන එජඩො මිලියන 56 ක් වන අතර එම මුදල අන්තර්ජාතික සංවර්ධන සංගමය විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2020 ජුනි 17 වන දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදල් උපයෝජනය කිරීමේ ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතිය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ ණය යටතේ ලැබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. මිලියන 3,068 ක් සහ විදේශ මූල්‍ය ආශ්‍රිත පිරිවැය යටතේ ලැබුණු රු. මිලියන 2,500 ක් අතරින් අනුපිළිවෙළින් රු. මිලියන 2,138.6 ක මුදලක් සහ රු. මිලියන 952.84 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ප්‍රතිපාදන ඵලදායි අන්දමින් හා කාර්යක්ෂමව උපයෝගී කර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ අරමුණ වන්නේ සෞඛ්‍ය, සමාජ ආරක්ෂණ, කෘෂිකර්ම, අධ්‍යාපන සහ ප්‍රවාහන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් භාවිතයෙන් දුරස්ථව රාජ්‍ය සේවා සැපයීම වැනි කෙටි හා මධ්‍ය කාලීන මැදිහත්වීම් සහිත ප්‍රතිචාර සැලැස්මක් ක්‍රියාත්මක කිරීමයි. ව්‍යාපෘතිය මගින් ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික භෝග නිෂ්පාදනය පළමු ප්‍රමුඛතාවය ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 66 ක් නියෝජනය කරමින් රු. මිලියන 2,014 ක මුදලක් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා ලබා දී ඇති අතර කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රු. මිලියන 116 ක ප්‍රතිපාදන ලබා දී ඇති අතර එය සමස්ත ප්‍රතිපාදනවලින් සියයට 04 ක් වූ බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | අරමුදල් වෙන් කර ඇති අරමුණුවලට අනුකූලව භාවිතා කළ යුතුය |